# 2
# ඉන්දියාවේ බෞද්ධ ආගමික ස්තූපවල බුදුන්වහන්සේ නිරූපණය කිරීම උදෙසා උපයුක්ත කැටයම් පිළිබඳ අධ්‍යයනයක්

*එස්. ජී. එම්. ප්‍රියංකර* [1]
HU/2012/2254

අශෝක රාජ්‍ය පාලන සමය එතෙක් පැවති ඉන්දියානු කලා සම්ප්‍රදායන් සඳහා බෞද්ධ මුහුණුවරක් ගනු ලැබූ කාල පරිච්ඡේදයක් විය. අශෝක රජු බුදු දහම වැළඳ ගැනීම ත්, වෙහෙර විහාර තැනීම ත් මෙහිදී කැපී පෙනේ. එසේ ගොඩනගන ලද ස්ථානයන් හි අලංකාරත්වය සඳහා නිරූපිත කැටයම්හි බුදුන් වහන්සේ වෙනුවට සංකේත භාවිත කිරීම දක ගත හැකිය. බුද්ධ චරිතයේ අවස්ථා, ජාතක කතා, ඓතිහාසික සිදුවීම් ඒ සඳහා යොදා ගනු ලැබූ තේමා විය. මෙහිදී බුද්ධ චරිතයේ හා ඓතිහාසික සිදුවීම් නිරූපණයේ දී ඡත්‍රය, සිරිපතුල, බෝධිය, චෛත්‍යය, ධර්මචක්‍රය, වජ්‍රාසනය, සේසත් වැනි සිදුවීමට වඩාත් උචිත සංකේත ඒ සඳහා යොදා ගැනිණි. බුදුන් වහන්සේගේ පෙර ආත්මභාවයන් ගෙනහැර දක්වන ලද විග්‍රහය ජාතක කතා ලෙස හඳුනා ගත හැකිය. එහිදී බෝධි සත්වයන් වහන්සේ සත්ව ස්වරූපයෙන් දක්වේ. වඳුරා, මුවා, ඇතා, නයා, කකුළුවා ඉන් කිහිපයකි. මේ ආකාරයට කැටයම් දක්වෙන ස්ථාන අතර සාංචි තොරණ සතර, භාරුත් ගල් වැටෙහි කැටයම් ප්‍රධාන ලෙස ද අමරාවති හා නාගර්ජුණකොණ්ඩ මුල්කාලින කැටයම් ද මේ සඳහා උදාහරණ වේ. සාංචි ශිල්පියා අඛණ්ඩකථන සම්ප්‍රදාය යොදා ගනිමින් සිදුවීම් එකිනෙක නාට්‍යානුසාරයෙන් දක්වා ඇත. මීට අමතර ව භාරුත් කැටයම් ශිල්පියා තේමාවට අදාළ සිදුවීම් කිහිපයක් එක් වෘත්තාකාර තලයකට ගොනු කිරීමට සමත් වීම ද දකගත හැකි විශේෂත්වයකි. සිදුවීමට වඩා වැදගත් ම අවස්ථාව යොදා ගනිමින් බුදුන් වහන්සේ සංකේතානුසාරයෙන් දක්වන ලද ස්ථානයක් ලෙසට නාගර්ජුණකොණ්ඩ කැටයම් හඳුනාගත හැකි ය. මේ ආකාරයට සිදුකරන ලද අධ්‍යනයේ දී ද්විතික මුලාශ්‍ර වශයෙන් ඉන්දියානු කලාව හා ඉතිහාසය පිළිබඳ ග්‍රන්ථ ද, තෘතික මුලාශ්‍ර ලෙස අන්තර්ජාලය ද පරිශීලනය සිදු කළ අතර එමගින් වැදගත් කරුණු රාශියක් ඒකරාශි කර ගැනීමට හැකියාව ලැබුණි. නරඹන්නා වෙත අවැසි සන්නිවේදනය එකී ආකාරයෙන් ම ගෙන හැර දක්වීමට කැටයම් ශිල්පීන් කටයුතු කළේය. එසේ හෙයින් මෙම කැටයම් ඉන්දියානු බෞද්ධ කැටයම් කලාවේ සුවිශේෂ තැනක් හිමිකර ගනී.

ප්‍රමුඛ පදඃ ඉන්දියානු කලා සම්ප්‍රදාය, අශෝක රාජ්‍ය පාලන සමය, සංකේත

1 දෘශ්‍ය කලා හා සැලසුම්කරණය (විශේෂවේදී) දෙවන වසර